**ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය - 2013**

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1956 අංක 11 දරන පනතින් සංශෝධිත රබර් පර්යේෂණ ආඥා පනතේ (439 වන අධිකාරිය) 8(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

මණ්ඩලයට අයත් ඩාර්ටන්ෆීල්ඩ් සහ කුරුවිට වතුවල මූල්‍ය ප්‍රකාශන ප්‍රමිති 01 හි දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2010 වර්ෂය දක්වා විගණන ගාස්තු මණ්ඩලය විසින් ගෙවා තිබුණද, ඒ දක්වා සිදුකර තිබුණු රු.981,102 ක අධි ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂයේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට දෛනික වැටුප් ලබන සේවකයින් 15 දෙනෙකු වෙනුවෙන් රු.491,400 ක් වූ විශ්‍රාම පාරිතෝෂික වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.7,013,298 ක් වටිනා ගබඩා තොග ආගණනය කිරීමෙන් තොරව පොත් අගය මත ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ඩාර්ටන් ෆීල්ඩ් රබර් කම්හලේ රබර් තොගය දුම්ගෙය, වේලුම් කුටීරය (Smoke House and Drying Tower) හා රේඩියේටර් පද්ධතිය 2014 ජනවාරි 24 දින ඇතිවූ හදිසි ගින්නක් හේතුවෙන් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි. කම්හල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.4,600,000 ක් වැයවන බවට ඇස්තමේන්තුකර තිබුණද ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් ලෙස එය ගිණුම්වල හෙළිදරව්කර නොතිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්වල දැක්වුනු රු.13,460,425 ක්වූ විවිධ ව්‍යාපෘති ප්‍රදාන වලට අදාල ගිවිසුම්, ප්‍රදාන වශයෙන් ලැබුණු ප්‍රාග්ධන භාණ්ඩ හා ඒවායේ වටිනාකම්, එම ප්‍රදාන ලැබුණු දිනයන්, ව්‍යාපෘතිය අවසන් කළ දිනයන්, ක්‍රමක්ෂය ආරම්භ කළ දිනයන් සහ ක්‍රමක්ෂය අනුපාත පිළිබඳ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.22,757,836 ක් වූ සාමාන්‍ය ණයගැති හා වෙනත් ණයගැති ගිනුම් ශේෂවල ඇතුළත් වර්ෂ 5 කට වඩා පැරණි ණය ගැතියන් 667 කට අදාල රු.15,186,913 ක් වූ ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් 1985 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා උපදේශක සේවා දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු රු. 5,214,500 ක් වූ අත්තිකාරම් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය දරන රබර් සංවර්ධන දෙපාර්මේන්තුවට අනුයුක්ත සේවකයන් වෙනුවෙන් 2000 සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා කාලයට අදාළව එම දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.1,747,981 ක් අයකරගෙන නොතිබුණි.

(ඈ) උපාධිධාරීන් පුහුණු කිරීම් වෙනුවෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් 2010 වර්ෂයේ සිට අයවිය යුතු රු. 712,426 ක් දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණු අතර, එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වසර 07 කට අධික කාලයක සිට පැවත එන එකතුව රු.10,940,983 ක් වූ ව්‍යාපෘති ණයගැති ශේෂයෙන් රු.3,776,532 ක ශේෂ 22 ක් අයවන බවට තහවුරු නොවුණි.

(ඊ) අයවිය යුතු තැන්පතු එකතුව රු. 426,013 ක ශේෂය තුළ ආයතන 11 කින් අයවිය යුතු රු.411,013 ක් වූ වසර 08 කට වඩා පැරණි ශේෂ ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) ගෙවිය යුතු ගිණුම් එකතුව රු.15,526,699 ක් තුළ අන්තර්ගත 2002 වර්ෂයේ සිට ජනතා පොහොර සමාගමට ගෙවිය යුතු රු. 298,577 ක් 2014 දෙසැම්බර් 08 දින දක්වාම නිරවුල් කර නොතිබුණු අතර අදාල බිල්පත් ආයතනය සතුව නොමැති බව නිරීක්ෂණය විය.

(ඌ) ආයතන 43 කට ගෙවිය යුතු වර්ෂ 2 ත් 5 ත් අතර කාලයකට අදාළ රු.627,318 ක් හා ආයතන 139 කට ගෙවිය යුතු වර්ෂ 5 ඉක්ම වූ රු. 5,788,450 ක ණය හිමි ශේෂ, ගිණුම්වල දිගින් දිගටම පෙන්වා තිබුණු අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2008 වර්ෂයට අදාළ රු.66,457 ක් වූ අතිකාල, ආදායමට ගැනීමට කටයුතු නොකර තවදුරටත් ගෙවිය යුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

## 2.4 නීති,රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති, රීති රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (අ) මුදල් රෙගුලාසි 371 (2) | (i) නිලධාරීන් 2 දෙනෙකු විසින් ලබාගෙන තිබුණු |

එකතුව රු. 48,000 ක් වූ තත්ත්කාර්ය අතුරු අග්‍රිම දින 13 - මාස 2 අතර කාලයක් අත රඳවාගෙන මුළු මුදලම ආපසු තැන්පත් කර තිබුණි.

(ii) නිලධාරීන් 12 දෙනෙකු විසින් ලබාගෙන තිබුණු එකතුව රු.158,000 ක් වූ තත්ත්කාර්ය අතුරු අග්‍රිම පියවීම මාස 3-10 ත් අතර කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 396 — නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 06 ක කාලය ඉකුත් වූ වටිනාකම රු.166,426 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 1646 — සංචිත වාහනවලට අදාල ධාවන සටහන් සාරාංශ පිළියෙළ කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 84,950,295 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. 68,627,910 ක ඌණතාවයක් විය. පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,322,385 ක පිරිහීමක් පෙන්නුම් කළ අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 24 ක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ වැටුප් හා වේතන සියයට 7 කින් වැඩිවීමත්, ඩාර්ටන්ෆීල්ඩ් වත්තේ ලාභය සියයට 42 කින් අඩුවීමත්, කුමාරවත්ත හා නාරම්පොල වතුයායේ අලාභය පිළිවෙලින් සියයට 34 කින් හා සියයට 31 කින් වැඩිවීමත් මේ සඳහා බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ  වතුවලට අදාල වියදම් හැරුනුවිට මණ්ඩලයේ මුළු වියදම රු.320,648,346 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ මුළු වියදම වූ රු. 312,621,408 සමඟ සැසඳීමේදී  සියයට 2.56 ක වැඩිවීමක් විය.

(ආ) ඩාර්ටන් ෆීල්ඩ් හා කුරුවිට, යන වතු වතු දෙකෙහි සමස්ථ ලාභය රු.39,908,882 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එය රු.53,689,073 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ලාභයේ අඩුවීම සියයට 25.7 ක් විය. කුමාරවත්ත හා නාරම්පොල යන වතු දෙකෙහි සමස්ථ අලාභය රු.9,997,046 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ අලාභය රු.7,506,187 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අලාභයේ වැඩිවීම සියයට 33.2ක් විය. වතු හතරම සැලකිල්ලට ගත්විට උපයන ලද සමස්ථ ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.29,911,836 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ එය රු. 46,187,887 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ලාභයේ අඩුවීම සියයට 35.2 ක් විය. රබර් විකුණුම් මිල පෙර වර්ෂයට සාපේක්ෂව  සියයට 9 කින් පහත වැටීමත්  අයහපත් කාලගුණික තත්ත්වය සහ අධික සේවක වැටුප්  මෙම ලාභය අඩුවීම කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

**3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් හෝ ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පුද්ගලයින් තිදෙනෙක් විසින්, සේවය නතර කිරීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලා ආයතනයට එරෙහිව නඩු 03 ක් ගොනු කර තිබුණි

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

2012 වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ඩාර්ටන්ෆීල්ඩ් වතුයායේ රබර් කිරි නිෂ්පාදනය හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 63 කින් අඩු වී තිබූ අතර, කුරුවිට වතුයායේ රබර් කිරි නිෂ්පාදනය හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 8 කින් වැඩි වී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේ කුඩා රබර් වතු හිමියන්ට රබර් පැල බෙදා හැරීම සඳහා මණ්ඩලයට සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 12 ක් වෙන්කර දී තිබුණු අතර හම්බන්තොට, අම්පාර, මුලතිව්, වව්නියාව සහ මොණරාගල යන දිස්ත්‍රික්ක 05 සඳහා රබර් පැල මිලදී ගෙන බෙදාහැර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන සඳහා වෙන්කර දී තිබුණු රු. මිලියන 12 ක ප්‍රතිපාදන ඉක්මවා පැල මිලදී ගැනීමට රු.956,700 ක් හා පැල ප්‍රවාහනය සඳහා රු.4,396,351 ක් වශයෙන් රු.5,353,051 වැඩිපුර වැයකර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී රු. 12,956,700 ක් වටිනා රබර් පැල මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

(ii) පැල බෙදාහරින ප්‍රදේශවලට ආසන්න පැල තවාන් වලින් මිලට නොගැනීම, වරකට ප්‍රවාහනය කළ යුතු අවම පැල සංඛ්‍යාව පිළිබඳ එකඟතාවයක් නොවීම. ප්‍රවාහන දුර සහ වාර ගණන ගණනය කිරීමට නිශ්චිත පාලන ක්‍රම අනුගමනය නොකිරීම ආදී හේතුන් මත පැල ප්‍රවාහන වියදම සමස්ථ වියදමෙන් සියයට 25 ක් ඉක්මවා තිබුණු අතර එක් පැලයක ප්‍රවාහන වියදම රු.20 කට ආසන්න අගයක් ගෙන තිබුණි.

(iv) ආරක්ෂිතව ප්‍රවාහනය නොකිරීම හේතුවෙන් රු1,001,440 ක් වටිනා රබර් පැල විනාශ වී තිබුණු අතර එම අලාභය ප්‍රවාහන කරුවන්ගෙන් අයකර ගැනීමටද කටයුතුකර නොතිබුණි.

(v) රබර් පැල මිලට ගැනීමට හා ප්‍රවාහනයට අදාල ගෙවීම් වවුචර් නියැදියක් පරීක්ෂා කිරීමේදී නිසි අනුමැතියකින් තොරව ගෙවීම් වවුචර් 23 කින් රු.9,220,452 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ)** ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු.4,600,000 ක් වැයවන බවට ඇස්තමේන්තු කර තිබුණු, 2014 ජනවාරි 24 දින ඇතිවූ හදිසි ගින්නක් හේතුවෙන් සම්පූර්ණයෙන්ම විනාශ වූ ඩාර්ටන් ෆීල්ඩ් රබර් කම්හලේ දුම්ගෙය සහ වේලුම් කුටීරය එහි පැරණි පොත් අගය වූ රු. 936,000 ක් වැනි කුඩා අගයකට රක්ෂණය කර තිබීම නිසා, රක්ෂණ වන්දි වශයෙන් ලැබුණු වටිනාකම රු.702,518 කට සීමා වී තිබුණි. විශ්‍රාම ගොස් තිබුණු කර්මාන්තශාලා නිලධාරී වෙනුවට

නුපුහුණු කළමනාකරන සහකාර වරයකු සහ ආබාධිත කාර්යාල සේවකයෙකු කර්මාන්තශාලාවට පත්කර තිබුණු අතර ඔවුන්ගේ තාක්ෂණික නොදැනුවත් බව සහ නොසැලකිල්ල හේතුවෙන් මෙම ගිනිගැනීම සිදුව ඇති බව අනාවරණය වී තිබූ නමුත් අදාල නිලධාරීන්ට විරුද්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

**(ඈ)** මණ්ඩලයට අයත් වතු 04 ට අදාළව සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා වූ එකතුව රු. 40,511,901 ක සේවක අර්ථ සාධක දායක මුදල් අරමුදලට බැරකිරීම දින 18 - මාස 5 අතර කාලයක් ප්‍රමාද කිරීම හේතුවෙන් රු.437,662 ක් අධිභාර වශයෙන් අරමුදලට ගෙවීමට සිදුව තිබුණි.

**(ඈ)** ආයතනය සතු ලොරි රථයක් බොඩි ගැසීමට රැගෙන ගොස් නැවත ලබානොදීම සම්බන්ධයෙන් ආයතනය විසින් අදාල පුද්ගලයාට එරෙහිව රු.730,000 ක වන්දි ඉල්ලා මතුගම දිසා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණු අතර එම නඩුවේ තීරණය අනුව විත්තිකරු වැරදිකරු වී තිබුණද අදාල මුදල 2014 දෙසැම්බර් 08 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ)** 2006 ජනවාරි 25 දිනැති NPA 08 ප්‍රසම්පාදන චක්‍රලේඛයේ 3.4 විධිවිධානවලට පටහැනිව 2013 ජනවාරි 10 සිට 2013 සැප්තැම්බර් 13 දක්වා කාලය තුළ අවස්ථා 9 කදී රු.1,109,115 ක් වටිනා තීන්ත මිලදී ගැනීමේදී මණ්ඩලයේ නමින් නොව වෙනත් ලියාපදිංචි ගැනුම්කරුවකුගේ නමට එම මිලදී ගැනීම් සිදුකර රු.118,833 ක් වූ වැට් බදු ප්‍රමාණයද එම ගැනුම්කරුවා නමින් ගෙවා තිබුණි

**4.3 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම**

කුමාරවත්ත හා නාරම්පොල වතුවල අයිතිය පවරා ගැනීම 2013 පෙබරවාරි අවසානයට පෙර සිදු කරන ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාව 2012 ඔක්තෝබර් 02 දින නියෝග කර තිබුණද, 2014 දෙසැම්බර් දක්වාම මණ්ඩලය ඒවා පවරා ගෙන නොතිබුණි. 2006 වර්ෂයේ සිට මෙම වතු දෙක වෙනුවෙන් රු.8,320,000 ක් කල්පිත කුළී මුදලක් ලෙස වෙන් කර තිබුණු අතර අයිතිය පවරා ගැනීම සඳහා රු.27,250,000 ක මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර තිබුණි.

**4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ශ්‍රවනාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2011 සැප්තැම්බර් 28 දින රු.28,838,759 කට පෞද්ගලික ආයතනයකට පවරා තිබුණු අතර, අදාල ඉදිකිරීම දින 270 ක් ඇතුළත නිමකළ යුතුව තිබුණි. 2013 සැප්තැම්බර් වන විටද මෙහි වැඩ නිමකර නොතිබුණු අතර ප්‍රමාද ගාස්තු සම්බන්ධ කොන්දේසි ගිවිසුමට ඇතුළත්කර නොතිබුණු බැවින් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට මණ්ඩලයට නොහැකිව තිබුණි. භූමියේ යෝග්‍යතාව පරීක්ෂා නොකර ඉදිකිරීම් සිදුකිරීම නිසා ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා පැතිබැම්මක් ඉදිකිරීමට සිදුව තිබුණු අතර, එම කාර්යයද කොන්ත්‍රාත්කරුට පවරා රු.2,007,487 ක අතිරේක වියදමක් දරා ඉදිකිරීම් සිදුකර තිබුණි.

(ආ) ශ්‍රවනාගාරයේ විදුලි ලාම්පු සවිකිරීම හා වායු සමීකරණය සඳහා ඇස්තමේන්තු මුදල රු.3,548,580 ක් වූ නමුත් රු.4,199,456 කට ඉහත ආයතනය සමඟ ගිවිසුමට එළඹ තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසුව මුල් ඇස්තමේන්තුව අනුව ශ්‍රවණාගාර ප්‍රධාන ශාලාවේ විදුලි ආලෝක ලාම්පු සවිකරන ආකාරය අපැහැදිලි බව සඳහන් කරමින් වෙනත් ආයතනයකින් නැවත ඇස්මේන්තුවක් ලබාගෙන තිබූ අතර එම ඇස්මේන්තුව අනුව අදාල කාර්යයෙහි වියදම රු.3,747,845.00 ක්ව තිබුණි. පසුව එයින්ද ඇස්තමේන්තුව රු.1,301,160 ක් වූ තෝරාගත් කාර්යයන් කිහිපයක් පමණක් නිමකිරීමට තීරණයකර තිබුණි.

**4.5 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී සිදුව තිබුණු වාහන අනතුරු 05 ක් හේතුවෙන් රු.1,392,269 ක අලාභ සිදුව තිබුණු අතර රක්ෂණ වන්දිවලින් ආවරණය නොවූ රු.185,372 ක් වූ අලාභයන් සඳහා වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර එම අලාභය ආයතනය විසින් දරා තිබුණි.

(ආ) කාලීනව වාහනවල ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂාකර ලොග් සටහන් පොත්වලට ඇතුළත් කර නොතිබුණි.

**4.6 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

වාහන 06 ක් අළුත්වැඩියා නොකර දීර්ඝ කාලයක් තිස්සේ ආයතන භූමියේ නවතා තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 470 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 355 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළවන අනුමත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 21 ක්, මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 27 ක්, කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 56 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 11 ක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) ආර්ථිකමය වශයෙන් ඵලදායී සහ පාරිසරික හිතකාමී තිරසාර නව සොයා ගැනීම් ඔස්සේ හඳුනාගත් නව තාක්ෂණය පුහුණු හා උපදේශන සේවා වගා කරුවන්ට හා රබර් භාණ්ඩ නිෂ්පාදකයින්ට ලබා දීම මඟින් රබර් කර්මාන්තය ප්‍රවර්ධනය මණ්ඩලයෙන් ඉටුවිය යුතු මෙහෙවර වන නමුත් එය ඉටුකර ගැනීමේ මූලික යාන්ත්‍රණය වන පර්යේෂණ කාර්ය මණ්ඩලය පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු අතර 2014 දෙසැම්බර් වන විටද පර්යේෂණ අංශ ප්‍රධානී තනතුරු 08 ක්, ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 07 ක්, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී තනතුරු 12 ක්, පර්යේෂණ නිලධාරී තනතුරු 14 ක්, පර්යේෂණ තාක්ෂණ නිලධාරී තනතුරු 23 ක් සහ උපදේශන නිලධාරී තනතුරු 03 ක් ආදි වශයෙන් පර්යේෂණ කාර්යයේදී වඩාත් වැදගත්වන තනතුරු 67 ක් වර්ෂ ගණනාවක සිට පුරප්පාඩුව පැවතුණි.

(ඇ) බඳවාගැනීමේ හා උසස්කිරීමේ පරිපාටි කලින් නිශ්චය කරගත් පුද්ගලයන්ට වාසිදායක වන පරිදි වරින්වර සංශෝධනය කිරීම්, විභාග පරිපාටි විනිවිද භාවයෙන් ක්‍රියාත්මක නොකිරීම්, පහළ නිලධාරීන් තම ආසන්නතම ප්‍රධානියා ඉක්මවා කටයුතු කිරීම් හා රාජකාරි ලිපි ගනුදෙනු කිරීම්, ඉහළ නිලධාරීන් විසින් ඒ ඒ අංශ ප්‍රධානීන් නොසලකා පහළ නිලධාරීන් සම්බන්ධයෙන් ඍජු මැදිහත්වීම් සිදුකිරීම් ආදී පරිපාලන දුර්වලතා රැසක් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට බාධාවන පරිදි ක්‍රියාත්මකව පවතින බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති පීඊඩී/12 චක්‍රලේඛයට අනුව වාර්ෂික ගිණුම් විගණනය සඳහා මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත ඉදිරිපත් කළයුතු වුවද මණ්ඩලයේ ගිණුම් මාස 05 දින 13 ක් ප්‍රමාදකර විගණනයට ඉදිරිපත් කරන ලදී.

### 5.2 සංයුක්ත සැලැස්ම

2013 – 2017 කාලය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, එහි පසුගිය වර්ෂවලට අදාල මූල්‍ය තොරතුරු හා වර්ෂ 5 තුළ ළඟා කර ගැනීමට අපේක්ෂිත භෞතික ඉලක්කවල මූල්‍ය වටිනාකම් ඉදිරිපත් කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 03 ක ඇස්තමේන්තුගත වියදම සියයට 5 සිට සියයට 62 ක පරාසයක් ඉක්මවා උපයෝජනය කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 60 ක් ඇස්තමේන්තු කර තිබුණද, තථ්‍ය වියදම රු.මිලියන 44.4 ක් විය. ඒ අනුව මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය පාලනය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) තොග පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඉ) පර්යේෂණ කටයුතු පරිපාලනය